**මුසලි ප්‍රාදේශීය සභාව**

**මන්නාරම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2020 ජූනි 30 දින හා 2020 ජූලි 22 දින සභාපතිවරයාට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මුසලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 3.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මෙම කාරණය වැරදි ගණනය කිරීම්වල සඳහන් නොවේ. අනාගතයේදී අනාවරණය කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

**(ආ) ගණකාධිකරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදල් මගින් සමාලෝචිත වර්ෂය තුළ මුසලි ප්‍රධාන කාර්යාලයේ සිදුකළ අලුත්වැඩියා කටයුතුවල වියදම වූ රු. 69,150 ක් ඇතුලත් කිරීම හේතුවෙන් වත්කම්වල වටිනාකම සහ සමුච්චිත අරමුදල රු. 69,150 කින් වැඩි වී තිබුණි. | අනාගතයේදී ගිණුම්වල නිවැරදි ලෙස සටහන් කරන ලෙස නිලධාරියාට උපදෙස් දී ඇත. | අළුත්වැඩියා කටයුතු සඳහා වන පිරිවැය පුනරාවර්තන වියදමක් ලෙස අනාවරණය කිරීමට පියවර ගත යුතුය. |

**(ඇ) නොසැසඳූ ගිණුම්**

**--------------------**

| | | | |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂය තුළ, ආදායම් 13 ක් සඳහා නිශ්චිත ආදායම් ලේඛනය සහ විෂය විශ්ලේෂණ කාලසටහන අතර රු. 1,040,276 ක වෙනසක් විය. | 2020 වර්ෂය සඳහා වන අවසාන වාර්තා ජර්නලය හරහා මෙම දෝෂය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. තවද, අනාගතයේදී එවැනි වැරදි වළක්වා ගැනීමට පියවර ගනු ඇත. | අදාළ ශේෂයන්හි වෙනස්කම් සැසදිය යුතු අතර ගිණුම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| **(ii)** | ආරම්භක ශේෂයේ වූ රු. 1,019,883 ක් සාතකාගාරයේ හිඟ කුලී මුදලින් සමන්විත වුවද, ණය ගැතියන්ගේ ආරම්භක ශේෂය රු. 1,238,924 ලෙස අවසන් ගිණුම්වල දක්වා තිබීම හේතුවෙන් රු. 219,040 ක වෙනසක් අනාවරණය විය. | ඉදිරි මූල්‍ය වර්ෂවලදී සලකා බලන අතර ගැලපීම් සිදු කරනු ඇත. | එවැනි ගිණුම්කරණ දෝෂ මඟහරවා ගත යුතුය. |

## 1.4 අනුකූල නොවීම

**------------------**

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

**-------------------------------------------------------------------------**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | ගණකාධිකාරීවරයාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ----------------------- | ------------------- | ------------------- | ----------- |
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත | | | |
| | 16(2) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරනු ඇත. | නියමිත කාල සීමාව තුළ වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි. | | | |
| | මුදල් රෙගුලාසි 371 | වසර දහඅටකට වැඩි කාලයක් සභාවේ නිලධාරියෙකුට අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු.149,469 ක විශ්‍රාම වැටුප පියවා නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට පියවර ගනිමින් සිටී. | මුදල් රෙගුලාසි අනුව සුදුසු පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,046,655 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,797,329 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,526,000 | 4,061,700 | 2,201,924 | 4,698,200 | 5,268,494 | 1,475,171 |
| බලපත්‍ර ගාස්තු | 515,000 | 952,470 | - | 490,000 | 566,371 | - |
| වෙනත් ආදායම් | 4,274,000 | 7,123,946 | 21,694 | 3,152,500 | 6,337,717 | 5,236,728 |
| | **8,340,700** | **12,712,582** | **2,723,618** | **8,340,700** | **12,712,582** | **6,711,899** |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 සිට සභාව සතු මස් වෙළඳසැල් කුලී ආදායමින් හිඟ හිට තිබුණු රු. 1,019,883 ක් සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | 2015 සිට හරක් මස් වෙළඳසැලේ හිඟ මුදල් නීතිඥයෙකු මාර්ගයෙන් අයකර ගැනීම සඳහා සභාවේ යෝජනාවක් සම්මත කරගන්නා ලෙස පළාත් පාලන ප්‍රාදේශීය සහකාර කොමසාරිස් ඔවුන්ට උපදෙස් දී තිබුණි. එබැවින් සභාවේ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා ආදායම් පරීක්ෂකවරුන්ගේ ලිපියක් මගින් අවසර ලබා ගන්නා ලදී. | හිඟ මුදල් අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |

### 2.2.3 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 2,602,419 ක උසාවි දඩ මුදල් අය කර ගත යුතුය. | උසාවි දඩ මුදල් අයකර ගැනීමට පියවර ගෙන තිබේ. | නියමිත කාල සීමාව තුළ උසාවි දඩ අය කර ගැනීමට පියවර ගත යුතුය. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු රු.2,016,750 ක් අය කර ගත යුතුය. | මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන තිබේ. | මුද්දර ගාස්තු අය කර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සුහසාධනය, පහසුකම්, මහජනතාවගේ සෞඛ්‍ය සම්පන්න පරිසරය, පොදු පහසුකම් සහ පොදු මහාමාර්ග, මහජන සෞඛ්‍ය සම්බන්ධ කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සභාව විසින් ඉටු කළ යුතු යුතුකම් සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 23 දිනැති අංක. General No.2018/61 දරන විගණකාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව සාගර හා සාගර සම්පත් ආරක්ෂා කරන අතරම තිරසාර සංවර්ධනය සඳහා තිරසාර දැනුවත්භාවය සහ සමුද්‍රීය හා සමුද්‍ර දූෂණය පාලනය කිරීමේ සැලසුම් සකස් කර නොතිබුණි. | 2019 වර්ෂයේ වෙරළ දූෂණ පාලන ව්‍යාපෘතිය අප විසින් ක්‍රියාවට නංවන අතර එය දිගටම ක්‍රියාත්මක කරනු ඇත. | තිරසාර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම සඳහා සුදුසු සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමටත්, මුහුදු හා සමුද්‍ර සම්පත් ආරක්ෂා කිරීමටත් පියවර ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 අගෝස්තු 04 දිනැති 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ තොරතුරු සඳහා ඉල්ලීම් 18 ක් සම්බන්ධයෙන් වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද ඉල්ලා ඇති තොරතුරු සභාව විසින් අදාළ පාර්ශවයන්ට ලබා දී නොතිබුණි. | සංවර්ධනය සඳහා අරමුදල් ලද විගස අංක 01, 02, සහ 4, 5, 6, 7, 8 යන ඉල්ලීම් සඳහා කටයුතු කරනු ලැබේ. මීට අමතරව, 3, 9, 10, 16 සහ 17 ඉල්ලීම් සම්පූර්ණ කර ඇත. | අදාළ පාර්ශවයන්ට නියමිත කාල සීමාව තුළ තොරතුරු සැපයීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේදී සභාව සතු ජල බවුසරය මගින් නිවාස ව්‍යාපෘතියක් සඳහා පානීය ජලය බෙදා හැරීම වෙනුවෙන් රු.327,264 ක ආදායමක් නියමිත කාල සීමාව තුළ අයකර ගැනීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ මුදල රු.2,000 ඉක්මවූ ණය ගැතියන්ට ලිපි යවා ඇත. | නියමිත කාල සීමාව තුළ හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | පසුගිය වසර 04 තුළ රු.95,800 ක හිඟ වාහන කුලී අයකර ගැනීමට සභාව විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | සභාවට ලැබිය යුතු වාහන කුලී හිඟ මුදල් එකතු කර ගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි යවා ඇති අතර පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වාහන කුලී හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ සභාවට අයත් JCB සහ Motor Crater බදු දීම වෙනුවෙන් හිඟහිටි රු.83,250 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාවේ වැඩ හැර වෙනත් වැඩ සඳහා ලැබිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ. | හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක ණය** | | |
| | පාලක මණ්ඩලයේ ලේකම් විසින් 2019 මැයි 27 වන දින සිට සේවය හැරයාම පිළිබඳ දැනුම් දීමේ ලිපියක් සභාවේ නිලධාරියෙකුට නිකුත්කර තිබුණි. හිඟ මුදල වූ රු.12,400 ක් නිලධාරීන්ගෙන් අයකර ගැනීමට සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ණය ආපසු ගෙවීම සඳහා අදාළ නිලධාරියාට පළමු සිහිකැඳවීම යවා ඇත. පසු විපරම් කටයුතු සිදුකරනු ලැබේ. | නියමිත කාල සීමාව තුළදී නිලධාරියාගෙන් ණය ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**(ආ) සේවක ඇප**

| | | |
|---|---|---|
| 2017 මාර්තු 04 දිනැති අංක. PF/01/2017(a) දරන පළාත් මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, සේවක ඇප තැන්පතු ලෙස අවම මුදල ලෙස රු.187,500 ක් ගෙවියයුතු වුවත් රු.121,000 ගෙවා තිබුණු අතර රු. 66,500 ක් අඩුවෙන් ගෙවා තිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් එකතු කිරීමට පියවර ගනිමින් සිටී. | අදාළ නිලධාරීන්ගෙන් හිඟ මුදල අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින ඉන්වෙන්ටරිවල භෞතිකව නොමැති අයිතම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශයට ගෙන නොතිබුණි. | වැරදීමකින් ගිණුමට ඇතුළත් කර නොතිබුණි. අනාගතයේදී වාර්ෂික විගණන වාර්තාවට ඇතුළත් කිරීමට උපදෙස් දෙනු ලැබේ. | තොගයේ ඇති ඉන්වෙන්ටරි අයිතම ඇගයීමට ලක් කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට පියවර ගත යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 අත්පත් කර නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව භාවිතා කරන ගොඩනැගිලි 18 කට අදාල ඉඩම්වල අයිතිය මේ වන තෙක් සභාවට පවරා නොතිබුණි. | ඉඩම නීත්‍යානුකූලව පැවරීමට පියවර ගන්නා ලෙස මුසලි ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි යවා ඇත. පසු විපරම් සිදු කරනු ලැබේ. | පවරා නොගත් ඉඩම්වල අයිතිය පැවරාගැනීමට සුදුසු පියවර ගත යුතුය. |

### 3.5.2 වාහන භාවිතය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුසලි ප්‍රාදේශීය සභාවේ PF–3331 දරන වාහනයේ දෛනික ධාවන සටහන්වලට අනුව, 2019 මැයි 01 සිට 2019 ජුනි 30 දක්වා කි.මී. 6,690 ක් ගමන් කර තිබුණු නමුත් පුද්ගලික ගමන් වල අරමුණ නිශ්චිතව දක්වා නොතිබුණි. | වාහනය ගමන් කිරීමේ අරමුණ නිශ්චිතව දක්වා සංශෝධනය කර ඇත. | ගමනේ අරමුණ නිසි පරිදි හෙළි කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මන්නාරම දිස්ත්‍රික්කයෙන් පිටත සභාවේ වාහනය භාවිතා කිරීම සඳහා පළාත් පාලන පළාත් කොමසාරිස්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, PF -3331 දරන වාහනය සභාවේ ගරු සභාපති විසින් පුත්තලම් දිස්ත්‍රික්කයට ගෙන ගොස් කි.මී. 1,150 ක් භාවිතා කර තිබුණද ගමනේ අරමුණු ප්‍රකාශ කර නොතිබුණි. | තවමත් අනුමැතිය ලබාගෙන නොමැති අතර නුදුරු අනාගතයේ දී තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනු ඇත. | නිසි ලෙස අනුමත කර භාවිතා කළ යුතු අතර ගමනේ අරමුණ නිසි ලෙස ප්‍රකාශ කළ යුතුය. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක. PFD/ASD/02/Veh. 2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව, පසුගිය වසර 07 ක කාලය තුළ සභාව විසින් භාවිතා නොකරන ලද වාහන 13 ක් සම්බන්ධයෙන් අඛණ්ඩව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පාවිච්චි කරන ලද වාහනවල අයිතිය පැවරා ගැනීමට හා ඇගයීම් සිදුකර විකිණීමට පියවර ගෙන තිබේ. | චක්‍රලේඛයට අනුව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අයවැය තුල ප්‍රාග්ධන කොන්ත්‍රාත් කටයුතු පිළිබඳ සඳහන් කිරීමෙන් තොරව 2019 වර්ෂයේ ක්‍රියාත්මක කළ යුතු වැඩ 02 ක් අවසන් කර ඇති බව නිරීක්ෂණය විය. | අනාගතයේදී එවැනි වැරදි වළක්වා ගැනීමට හැකිවන පරිදි එය සකස් කරනු ඇත. | වාර්ෂික අයවැය ප්‍රාග්ධන කොන්ත්‍රාත් වැඩ ඇතුළුව කාර්යක්ෂමව සකස් කළ යුතුය. |